සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

15 | S | I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :.................................... ක්‍රිස්තියානි ධර්මය - I කාලය: පැය 01යි.

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) ''සනදුරු දේශයේ විසුවන්ට ආලෝකයක් වූයේ,
1. ජේසුස් වහන්සේ ය.
2. ස්නාවක ජොහාන් ය.
3. මරිය තුමිය ය.
4. එළිසබෙත් තුමිය ය.

(2) එතුමාණෝ යුක්තියෙන්ද, ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක'' මෙම දිවැස් වැකිය ප්‍රකාශ කරන ලද්දේ
1. මලාකි දිවැසිවරයා ය.
2. මීකා දිවැසිවරයා ය.
3. සෙකරියා දිවැසිවරයා ය.
4. යෙසායා දිවැසිවරයා ය.

(3) රෝම පාලනයෙන් පීඩාවට පත්ව සිටි පලස්තීන ජනතාවට විමුක්තිය උදා වූයේ,
1. ස්නාවක ජොහන්ගේ උපත මගින් ය.
2. ජේසුස් වහන්සේගේ උපත මගින් ය.
3. සීමොන්තුමාගේ උපත මගින් ය.
4. සෙකරියස්තුමාගේ උපත මගින් ය.

(4) ''ලෝකයේ පව් දුරු කරන දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ යනුවෙන් ජේසුස් වහන්සේව සමාජයට හඳුන්වා දුන්නේ,
1. මරියතුමී ය.
2. ග්‍රාබ්‍රියෙල් දේව දූතයා ය.
3. ජේසුස් වහන්සේ ය.
4. සිමියොන් ය.

(5) ''මෙහෙසුරු දිවැසිවරයා ලෙස හඳුන්වනු ලැබුයේ,
1. සෙකරියස් ය.
2. ස්නාවක ජොහාන් ය.
3. ජේසුස් වහන්සේ ය.
4. සිමියොන් ය.

(6) සෙකරියස් පූජකතුමා ගොළු බවට පත් වූයේ
1. දෙවිඳුන්ට අවමන් කළ නිසා ය.
2. සිය බිරිඳ මහළු යැයි කියූ නිසා ය.
3. දේව කන්නලව්ව අතහැර දැමූ නිසා ය.
4. දේව පණිවිඩය අවිශ්වාස කළ නිසා ය.

(7) ජුදෙව් මෙසියස් බලාපොරොත්තුව ඉක්ම වූ ජේසුස් වහන්සේ අනුගමනය කරන ඔබ නියත වශයෙන්ම,
1. විමුක්ති අරගලයේ සටන් පාඨ කියන අයෙක් විය යුතු ය.
2. පාපයේ වහල් භාවය හඳුනාගත් අයෙකු විය යුතුය.
3. පූර්ණ විමුක්තිය කරා ගමන් කරන්නෙකු විය යුතු ය.
4. මෙසියානු සංකල්පය නිර්වචනය කරන අයෙකු විය යුතු ය.

(8) ''බලන්න මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා'' මරියතුමියගේ මෙම ප්‍රකාශය තුළින් ගම්‍ය වන්නේ,
1. නිහතමානීකම ය.
2. ආත්මාර්ථකාමී බව ය.
3. පර්ත්‍යාගශීලී බව ය.
4. පරාර්ථකාමී බව ය.

(9) ''මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන් ලෙස'' මරියතුමී හඳුනාගනු ලැබූයේ,

1. එළිසැබෙත් ය.
2. ග්‍රාබියෙල් දේවදූතයා ය.
3. මාර්තා ය.
4. අන්නා දිවැසිවරිය ය.

(10) මරියතුමියගේ ජීවිත ආදර්ශයට අනුව, කිතුණු ඔබ ජීවත් විය යුත්තේ

1. දේව කැමැත්තට බිය වීමෙන් ය.
2. දේව කැමැත්තට අවනත වීමෙන් ය
3. දේව කැමැත්ත පිළිබඳ උදම් ඇනීමෙන් ය.
4. දේව කැමැත්ත ප්‍රතික්ෂේප කිරීමෙන් ය.

(11) ව්‍යවස්ථාව තමන්ගේ වාසියට අර්ථකථනය කර ගනු ලැබූයේ,

1. සාමාන්‍ය ජනතාව ය.
2. ගෝලයින් ය.
3. පරිසිවරුන් ය.
4. කාන්තාවන් ය.

(12) ''ඔහු මිදි යුෂවත් මත්පැන්වත් නො බොන්නේ ය'' යනුවෙන් අවධාරණය කරනු ලැබූයේ,

1. ජේසුස් වහන්සේ පිළිබඳව ය.
2. පේදුරු පිළිබඳව ය.
3. පාවුල්තුමා පිළිබඳව ය.
4. ස්නාවක ජොහාන් පිළිබඳව ය.

(13) ''ක්‍රිස්තුස්'' නම් ගැළවුම්කරුවාණන් හඳුනා ගැනීමට දේව දූතයා එඬේරුන්ට දුන් සළකුණ වන්නේ,

1. වල්ගා තරුව ය.
2. ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ය.
3. ගවයින් සිටින ගව ලෙන ය.
4. බැටළුවන් සිටින මඩුවක් ය.

(14) පැමිණෙන්න සිටින තැනැන් වහන්සේගේ රාජ්‍ය තුළ දක්නට ලැබෙන ගුණාංගයන් වන්නේ,

1. යුක්තිය හා සාධාරණත්වය
2. යුක්තිය හා බලය ය.
3. යුක්තිය හා ධර්මිෂ්ඨකම ය.
4. යුක්තිය හා ප්‍රේමය ය.

(15) ජේසුතුමාගේ උපත පිළිබඳ සුභාරංචිය දේව දූතයා මුලින් ම දන්වනු ලැබූයේ,

1. එඬේරුන්හට ය.
2. හෙරොද් රජතුමාට ය.
3. ශාස්ත්‍රවන්තයින්ට ය.
3. පාරාවෝ රජතුමා ය.

(16) කාලය හෝ වයස දේව සැලැස්ම ඉටු කිරීමට බාධාවක් නොවන බව අපට පසක් කරන්නේ

1. මරියතුමියගේ ජීවිතය තුළින් ය.
2. එළිසැබෙත් තුමියගේ ජීවිතය තුළින් ය.
3. අන්නාතුමියගේ ජීවිතය තුළින් ය.
4. සිමියොන් තුමාගේ ජීවිතය තුළින් ය.

(17) ජේසු උපත ඵලදායී ලෙස සැමරීමට නත්තල් සමයේ දී කිතුණු අප කළ යුතු වන්නේ,

1. දේවස්ථානයේ කැරොල් ගී වලට සහභාගී වීම ය.
2. නත්තල් සමයේ හුදකලාව යාච්ඤා කිරීම ය.
3. නත්තල් දින ප්‍රිය සම්භාෂණ පැවැත්වීම ය.
4. අවශ්‍යතා සහිත අය සමඟ නත්තල් ප්‍රීතිය බෙදා ගැනීම ය.

(18) ''දෙවියන් වහන්සේ ඇසූ සේක'' යන අර්ථය ගෙන දෙන නාමය වූයේ,

1. සිමියොන් ය. 2. සෙකරියස් ය. 3. අන්නා ය. 4. ජෝසෙප් ය.

(19) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න

A - චර්මඡේදනය
B - කැප කිරීමය
C - වනාන්තරගත වීම
D - යාච්ඤා කිරීම

මරියතුමී හා ජෝසෙප්තුමා ජේසුතුමා වෙනුවෙන් ඉටු කලාවූ පිළිවෙත් දැක්වෙන පිළිතුර වන්නේ,

1. A හා C ය. 2. B හා D ය. 3. A හා D ය. 4. A හා B ය.

(20) ජේසු බිළිඳාට ''ජේසුස්'' යන නාමය තබනු ලැබූයේ,

1. කැප කරනු ලැබූ අවස්ථාවේ දී ය.
2. චර්මඡේදනය පිළිවෙත් කළ අවස්ථාවේ දී ය.
3. දේව මාළිගාවට ගෙන ගිය අවස්ථාවේ දී ය.
4. පාස්කු මංගල්‍ය සිදු කළ අවස්ථාවේදී ය.

(21) ''ටෝරාව'' ලෙස හඳුන්වනු ලැබුයේ,

1. පඬිවරුන්ගේඉගැන්වීම ය.
2. ශු. බයිබලය ය.
3. ජුදෙව් ව්‍යවස්ථාවය.
4. යෙසායාගේ ග්‍රන්ථය ය.

(22) කිතුණුවන් දේශීය වත් පිළිවෙත් ඉටු කිරීමේ දී මුල්තැනක් ලබාදිය යුත්තේ,

1. ගමේ නායකයන් ට ය.
2. දෙවියන් වහන්සේ ට ය.
3. ගමේ වෙද තුමාට ය.
4. ගුරුන්නාන්සේට ය.

(23) ''ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?'' මෙම ප්‍රකාශය කරනු ලැබූයේ කවුරුන් විසින් ද?

1. ජේසුස් වහන්සේ විසින් පඬිවරුන්ට ය.
2. ජේසුස් වහන්සේ විසින් මරියතුමියට ය.
3. ජේසුස් වහන්සේ විසින් සෙනඟට ය.
4. ජේසුස් වහන්සේ විසින් ජොසෙප්ට ය.

(24) ස්නාවක ජොහන් බෙදා ගැනීම පිළිබඳ ව දේශනා කළේ කාහට ද?

1. රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට ය.
2. ආරක්ෂක අංශයේ යෙදී සිටි අයට ය.
3. ජුදා ආගමික ජනතාවට ය.
4. සාමාන්‍ය පොදු ජනතාවට ය.

(25) සමාජයේ ජීවත් වීමේදී අභියෝග ඉදිරියේ යහපත්ව ක්‍රියා කිරීමට ඔබට මඟ පෙන්වනු ලබන්නේ,

1. දේශනා කිරීම මගින් ය.
2. නායකත්වය දැරීම මගින් ය.
3. මනස්ථාපනය මගින් ය.
4. අනුශාසනා කිරීම මගින් ය.

(26) පහත දැක්වෙන්නේ ප්‍රස්තා පිරුළු කිහිපයකි.

A - ගමේ දිවැසිවරයා ගමට අගේ නැත.
B - උගුරට හොරා බෙහෙත් බොනවා වගේ
C - වෙදතුමාණෙනි ඔබ ඔබ ම සුවකරගන්න.
D - ගමේ වෙදතුමා ගමට අගේ නැත.

නාසරත් සිනගෝගයේදී ජේසුතුමා ප්‍රකාශ කළ පිරුළු අඩංගු පිළිතුර වන්නේ,

1. A හා C ය.
2. A හා D ය.
3. B හා C ය.
4. C හා D ය.

(27) ස්නාවක ජොහන්තුමා ජුදා ජන කොටසට පමණක් සීමා නොකරමින් අන්‍ය ජාතීන්ට ද මනස්ථාපනයට අවස්ථාව ලබා දුන්නේ,

1. සියලු දෙනාටම දේශනා කිරීමෙන් ය
2. ජොර්දාන් ගඟෙන් බෞතීස්ම කිරීමෙන් ය.
3. වනාන්තරගතව යාච්ඤා කිරීමෙන් ය.
4. ඔවුන්ගේ වැරදි ගැන තරවටු කිරීමෙන් ය.

(28) ජේසුස් වහන්සේ සුබ අස්න ප්‍රකාශ කිරීමේ තම මෙහෙය ආරම්භ කරනු ලැබූයේ,

1. ජුදය ප්‍රදේශයෙනි.
2. ඉතුරිය ප්‍රදේශයෙන් ය.
3. ගලීල ප්‍රදේශයෙනි.
4. අබිලෙනය ප්‍රදේශයෙනි.

(29) ජේසුස් වහන්සේගේ සේවයේ ඉලක්කයක් මනාව පැහැදිලි වූයේ,

1. මිටියාවතේ දේශනාව මගින් ය.
2. ස්නාවක ජොහන්ගේ දේශනාව මගින් ය.
3. තමාට එල්ල වුණු විවේචන ප්‍රතික්ෂේප කිරීම මගින් ය.
4. නාසරත් සිනගෝගයේ දේශනාව මගින් ය.

(30) ස්නාවක ජොහන්ගේ දේශනා වර්තමානයේ ජීවත්වන අපට ගැළපෙන්නේ,

1. නිහතමානිත්වය පිළිබඳ පණිවිඩයක් ලැබෙන නිසා ය.
2. සමාජ පරිවර්තනයකට අදාල කරගත හැකි නිසා ය.
3. පෙරමග දූත සේවය පිළිබඳ ඉඟි ලැබෙන නිසා ය.
4. බෞතීස්මය මගින් පව්කමාව ලැබෙන නිසා ය.

(31) වර්තමාන ධර්ම දූතකයින් තම සේවය ඉටු කිරීමේදී,
1. සේවයෙන් ලැබෙන වරප්‍රසාද පිළිබඳ සතුටු විය යුතු ය.
2. සේවයෙන් ලැබෙන ප්‍රසංශා පිළිබඳ සතුටු විය යුතුය.
3. සේවයට කැඳවීම පිළිබඳව සතුටු විය යුතුය
4. සේවයේ දුෂ්කරතා විඳ දරා ගත යුතු ය.

(32) ජේසුස් වහන්සේ ප්‍රථමයෙන් කැඳවනු ලැබූ ගෝලයන් හතර දෙනා දක්වෙන පිළිතුර වන්නේ,
1. පේදුරු, මතෙව්, ජාකොබ් හා ජොහන් ය.
2. ජාකොබ්, පේදුරු, අන්දෘ, මතෙව් ය
3. ජොහන්, ජාකොබ්, අන්දෘ, මතෙව් ය.
4. පේදුරු, ජාකොබ්, ජොහාන්, ඇන්දෘ ය.

(33) නාසරත් ධර්ම දේශනාව මගින් ජේසුස් වහන්සේගේ ආලෝකය ලැබුවන් අඩංගු පිළිතුර වන්නේ,
1. දිළින්දන්, වහලුන්, අන්දයින් හා පීඩිතවූවන් ය.
2. දිළින්දන්, රෝගීන්, ළදරුවන් හා පීඩිතයන් ය.
3. දිළින්දන්, වහලුන්, රෝගීන් හා අන්ධයින් ය.
4. දිළින්දන්, අන්ධයින්, ළදරුවන් හා වහලුන් ය.

(34) පේදුරු යන නාමයේ අර්ථය වූයේ,
1. පර්වතය යන්න යි. 2. නායකයා යන්නයි.
3. නොසැලෙන යන්නයි 4. සේවය කරන්නා යන්නයි.

(35) ''එතුමන්ගේ පාවහන්වල පටි මුදන්නටවත් මම නොවටිමි'' යනුවෙන් ස්නාවක ජොහන් අවධාරණය කළ ගුණාංගය වූයේ,
1. එඩිතර බවය. 2. කීකරු බව ය. 3. යටහත් පහත් බවය 4. පොදු බව ය.

(36) ''ඔබගේ වචනය නිසා දැල් හෙලමි'' යන ප්‍රකාශය කරනු ලැබූයේ කවුරුන් විසින් කා හට ද?
1. පේදුරු විසින් අන්දෘට ය. 2. පේදුරු විසින් ජේසුස් වහන්සේට ය.
3. ජොහන් විසින් ජ්සුස් වහන්සේට ය. 4. ජොහාන් විසින් පේදුරුට ය.

(37) වර්තමාන ශ්‍රී ලංකාවේ පවුල තුළ ගැටුම්කාරී තත්වයන් ඇතිවීමට හේතුවක් වන්නේ,
1. පවුල තුළ පුරුෂාධිපත්‍ය ගොඩ නැගීමයි. 2. පවුලේ අය නොයෙක් දුරාචාර වලට ඇබ්බැහි වීමය.
3. කාන්තාවන් විදෙස්ගත වීම ය. 4. එකිනෙකා වෙත වැය වීමට ඇති අකමැත්ත ය.

(38) කිතුණු දරුවෙකු ලෙස ඔබට යම් ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු වූ විට ඔබ කළ යුතු වන්නේ,
1. ප්‍රශ්නවලින් පලා යාමට කටයුතු කිරීම යි. 2. දේව මග පෙන්වීම අනුව කටයුතු කිරීම යි.
3. තාවකාලිකව සහනයක් වෙත යොමුවීම යි. 4. මිතුරන්ගේ උදව් උපකාර අයදීම යි.

(39) ජුදෙව්වරු සියලු පිළිවෙත් ඉටු කිරීමේදී දක්නට ලැබුණා වූ ගුණාංග වූයේ,
1. කැපවීම, කීකරුකම, වැයවීම හා ඉවසීම යි
2. භක්තිමත්කම, වැයවීම, ගරු කිරීම හා කීකරුකම ය.
3. භක්තිමත්කම, කීකරුකම, කැපවීම හා වැයවීම ය.
4. ඉවසීම, වැයවීම, ගරුකිරීම හා කැපවීම ය.

(40) සදාතන ජීවනය උරුම කර ගැනීම සඳහා අප කළ යුතු වන්නේ,
1. හොඳින් කා බී විනෝද වීමයි. 2. ජේසුස් වහන්සේ අනුගාමී වීමයි.
3. හොඳ රැකියාවක නිතර වීමයි. 4. සැමදා දේවස්ථානයට යැමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

15 | S | II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :....................................... ක්‍රිස්තියානි ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) ''එම්මානුවෙල්'' යන නම තැබුවේ කා හට ද? එම නාමයේ අර්ථය ලියන්න.

(ii) ජුදා සමාජයේ කොන් කළ ජන කොටස් දෙකක් ලියා දක්වන්න.

(iii) ''මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත'' මෙම ප්‍රකාශය කරනු ලැබුයේ කවුරුන් විසින් කාහට ද?

(iv) ජේසුතුමා තුළ තිබුණා වූ සුවිශේෂී ගුණාංග දෙකක් ලියන්න.

(v) ජේසුස් වහන්සේගේ උපතේ සුවිශේෂත්වය පිළිබඳව මතෙව් තුමා පෙන්වා දීමට යොදාගන්නා සංකේත දෙක මොනවා ද?

(vi) කිතුණු ආගමික වත් පිළිවෙත් දෙකක් ලියන්න.

(vii) ජෙරුසලම් දේව මාළිගාවේදී ජේසුස් වහන්සේ මෙසියස් ලෙස හඳුනාගනු ලැබුයේ කවුරුන්ද?

(viii) රෝම අධිරාජ්‍යයාගේ කාලයේ ජුදා ජනතාව පීඩනයට පත් වී සිටියේ ඇයි?

(ix) දේව රාජ්‍යය අන්‍යයන්ට ද විවෘතව පවත්නා බව පෙන්වීමට පැරණි ගිවිසුමෙන් උදාහරණ දෙකක් පෙන්වා දෙන්න.

(x) ජුදෙව් සමාජයේ තෙලින් ආලේප කරනු ලැබූ කණ්ඩායම් දෙකක් පෙන්වා දෙන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(2) (i) බෞතීස්මය මගින් සංකේතවත් කරනු ලැබුයේ කුමක්දැයි පෙන්වාදෙන්න. (ල. 2)

(ii) ස්නාවක ජොහන් සාමාන්‍ය ජනතාවට. අයකැමියන්ට සහ හේවායන්ට පැවසූ වදන් වල අදහස පෙන්වා දෙන්න. (ල. 3)

(iii) වර්තමාන සමාජය තුළ ඔබ ජීවත් විය යුතු ආකාරය පෙන්වා දෙන්න. (ල. 5)

(3) (i) ''ජේරිත'' යන්නෙහි අර්ථය පෙන්වා දෙන්න. (ල. 2)

(ii) ධර්මදූත සේවය සඳහා පිටත්කර යැවූ ශ්‍රාවකයන් 12 දෙනාට දුන් උපදෙස් තුනක් ලියන්න. (ල. 3)

(iii) ධර්මදූත සේවය සඳහා ඔබට කැඳවීමක් ලැබුණොත් ඔබ ක්‍රියාකළ යුතු ආකාරය කරුණු පහකින් පෙන්වා දෙන්න. (ල. 5)

(4) (i) දේව සැලැස්මට අවනත වූවන් දෙදෙනා කවුරුන්ද? (ල. 2)

(ii) සෙකරියස් පූජකතුමා තුළ දක්නට ලැබුණා වූ ගුණාංග තුනක් පෙන්වා දෙන්න. (ල. 3)

(iii) සෙකරියස් පූජකතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයේ වර්ධනය කරගත යුතු ගුණාංග 5 ක් විස්තර කරන්න (ල. 5)

(5) (i) ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට සන්තක වීමේ තත්වයට ඇතුල් වන්නේ කුමන පිළිවෙතක්ඉටු කිරීමෙන්ද? (ල. 2)

(ii) ජුදෙව් පිරිමි දරුවන් කැප කිරීම කුමන සිද්ධියක් සමඟ බැඳී පවතී ද? එම සිද්ධිය පැහැදිලි කරන්න.(ල. 3)

(iii) දේශීය සිංහල සිරිත් විරිත් චාරිත්‍ර වාරිත්‍ර භාවිතා කළ යුත්තේ කෙසේද? ඒ මන්ද පෙන්වා දෙන්න. (ල. 5)

(6) (i) ජේසුතුමා කැඳවනු ලැබූ මුල් ගෝලයින් දෙදෙනෙක් නම් කරන්න. (ල. 2)

(ii) ශ්‍රාවකයින් කැඳවීමේදී ජේසුතුමා දක්වූ විශේෂිත ලක්ෂණ 3 ක් පෙන්වා දෙන්න. (ල. 3)

(iii) වර්තමාන සමාජයෙන් කිතුණු ඔබගෙන් ජේසුතුමා බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයේ සේවාවක්දැයි කරුණු 5කින් විස්තර කරන්න. (ල. 5)

(7) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ජේසුස් වහන්සේගේ සේවය

(ii) ස්නාවක ජොහන්ගේ සේවය

(iii) මුල් ශ්‍රාවකයින් කැඳවීම

(iv) චර්මඡේදනය (ල. $5 \times 2 = 10$)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

15 S I II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

## ක්‍රිස්තියානි ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 3 | 21 | 3 | 31 | 4 |
| 2 | 4 | 12 | 4 | 22 | 2 | 32 | 4 |
| 3 | 2 | 13 | 2 | 23 | 2 | 33 | 1 |
| 4 | 3 | 14 | 3 | 24 | 4 | 34 | 1 |
| 5 | 2 | 15 | 1 | 25 | 3 | 35 | 3 |
| 6 | 4 | 16 | 2 | 26 | 1 | 36 | 2 |
| 7 | 3 | 17 | 4 | 27 | 2 | 37 | 4 |
| 8 | 1 | 18 | 1 | 28 | 3 | 38 | 2 |
| 9 | 1 | 19 | 4 | 29 | 4 | 39 | 3 |
| 10 | 2 | 20 | 2 | 30 | 2 | 40 | 2 |

### II පත්‍රය

(1) (i) ජේසුස් වහන්සේට
දෙවියන් වහන්සේ අප සමඟයි
(ii) රෝගීන / දිළින්දන් / ළදරුවන්
(iii) ග්‍රාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියතුමිහට
(iv) යුක්තිය - ධර්මිෂ්ටකම
(v) පායන ලද සුවිශේෂි තාරකාව / ශාස්ත්‍රවන්තයින් පැමිණීම රන් තුවරලා, ගන්දරසය පූජා කිරීම
(vi) බෞතීස්ම කිරීම / කැප කිරීම / ස්ථිර කිරීම
(vii) සිමියොන් සහ අන්නා
(viii) එවකට පැවති නීතිරීති / දැරිය නොහැකි බදු බර
(ix) එළියා දිවැසිවරයාට ශාරපත්හි වැන්දඹුව මගින් ආහාර ලබා දීම
නාමන්ව එළියා දිවැසිවරයා මගින් සුවය ලබා දීම
(x) රජවරු / පූජකවරු / දිවැසිවරු (ලකුණු $2 \times 10 = 20$)

(2) (i) * දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත්වීම උදෙසා ජීවිත පරිවර්තනයක නවතාවයක් ඇතිකර ගැනිම.
* මනස්ථාපනයේ ජීවිතයකට යොමු වීම (ල. 2)
(ii) බෙදා ගැනීම, පෝෂණය, සැමට ලබාදීම, අවංක වීම, සාධාරණ වීම (ල. 3)
(iii) * එකිනෙකා සමඟ සහෝදරත්වයෙන් හා එකමුතු කමින්
* ආත්මාර්ථකාමී නොවී තමාට ඇති දේ බෙදා ගනිමින්
* තමන්ගේ අවශ්‍යතා මෙන්ම අන් අයගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වීමෙන්
* සමාජය තුළ තමා කරන ඕනෑම කාර්යය භාර්යකදී අවංකව කාර්යක්ෂම ව වැඩ කිරීමෙන්
* තරාතිරම් නොබලා අධික ලාභ නොලබා සාධාරණව හා යුක්තිගරුකව සේවය කරමින් ජීවත්වීම.
* වැරැදි පවතින ස්ථානවලදී එය නිවැරැදි කිරීමට උත්සාහ කරමින් යහගුණ පිරි සමාජයක් උදෙසා ක්‍රියාකාරී වීමෙන්
(ල. 5)

(3) (i) ''විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූ'' යන්නයි. (ල. 2)
(ii) * සැරයටියක්, මල්ලක්, රොටි, මිල මුදල්, කමිස 2 ක් රැගෙන නොයන්න
* සුභ අස්න පිලිගන්නා අය සමඟ නතර ව සිටින්න.
* පිළි නොගන්නා අයගෙන් ඉවත්වන්න පාද වලින් දූවිලි ගසා දමන්න.
* චාම් දිවි පෙවෙතක් පවත්වා ගන යන්න. (ල. 3)

(iii) * යාච්ඥාවෙන් දේව මග පෙන්වීම අයැද සිටීම.
* චාම් දිවි පෙවෙතක් අනුගමනය කිරීම
* සුබ අස්න ප්‍රකාශ කිරීමට මුල්තැනක් ලබා දීම
* ජනතාවට උපකාර කරන්නකු වීම (ල. 5)

(4) (i) සෙකරියස් පූජකතුමා / මරියතුමී (ල. 2)
(ii) * දැහැමි බවින් යුක්ත වීම.
* දේව අණ පණත් නිසි ලෙස ඉටු කළ පූජකතුමකි.
* දෙවියන් වහන්සේට ගරුබිය දැක්වූවෙකි.
* දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන් දිගුකලක් දේව කන්නලව්වවේ යෙදුණු කෙනෙකි. (ල. 3)
(iii) * දෙවියන් වහන්සේට නිරන්තරයෙන් යාච්ඥා කිරීම
* දෙවියන් වහන්සේට ගරුබිය ඇතිව යහපත් ජීවිතයක් ගත කිරීම.
* දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියා කිරීම.
* ධාර්මික ජීවිතයකට මුල්තැනක් දීම.
* දිව්‍ය පූජාවට දිනපතා සහභාගි වීම. (ල. 5)

(5) (i) චර්මඡේදන පිළිවෙත (ල. 2)
(ii) නික්මයාම සිද්ධිය
මිසරයේ වහල් සේවයට පත්ව සිටි ඉශ්‍රායෙල් ජනතාව මෝසෙස්තුමාගේ නායකත්වය යටතේ දේව අභිමතය පරිදි වහල් බැම්මෙන් මිදී කානාන් දේශයට පැමිණීම සහ වහල්කමින් මිදී මිසර දේශයෙන් පිටවූ රාත්‍රියේ දී ඉශ්‍රායෙල් ජනතාවගේ කුලුඳුල් දරුවන් විනාශ නොවුනි. එම රැකවරණය සිහි කරනු පිණිස ජුදෙව් කුළුඳුල් පිරිමි දරුවන්ට දින 40 ක් ගත වූ විට දේව මාළිගාවේ කැප කරන ලදී. (ල. 3)
(iii) * දේශීය සිරිත් ඉටු කිරීමේදී යාච්ඤාවට දේව ගෞරවයට මුල්තැනක් දිය යුතුය.
* චාරිත්‍ර ඉටු කිරීමේදී සහභාගි වීම එකමුතුකම වර්ධන කරගත යුතු ය.
* රටේ සියලු දෙනා එක වේලාවක එකම කාර්යේ යෙදේ. එක සිතුවිල්ලකට යොමු වේ.
* සහභාගිකම වර්ධනය වේ.
* පොදු බව ආරක්ෂා කිරීමට හේතුවේ. (ල. 5)

(6) (i) සීමොන් පේදුරු / ජාකොබ් / ජොහන් (ල. 2)
(ii) * ඔවුන් රැකියා කරන ස්ථානයට ගොස් කැඳවීම
* තරාතිරම් නොබලා විවිධ කොටස් වලින් තේරීම
* කාන්තාවක්ද පිළිගෙන අනුගාමිකත්වයට කැඳවීම (ල. 3)
(iii) * සියලු ජන කොටස් භේදයකින් තොරව පිළිගැනීමට
* රෝගී අවස්ථාවලදී කරදර වලදී පිහිටවීම
* දේව වචනයෙන් අවශ්‍ය අවස්ථාවලදී දිරිය දීම.
* ප්‍රේමයෙන් සහෝදරත්වයෙන් ක්‍රියා කිරීම
* සමාජයේ කොන්වූවන් පිළිගෙන සේවය කිරීම (ල. 5)

(7) කෙටි සටහන්
(i) ***ජේසුස් වහන්සේ ගේ සේවය***
දිළින්දන්ට සුභාරංචිය දේශනා කිරීම, වහලුන්ට මිදීම අන්දධයින්ට පෙනීම, පීඩිතවූවන් මිදීම, ශාරීරික මානසික ආගමික හා සමාජමය ලෙස දිලිඳු වූ සැමට සුභ අස්න දෙසීම හා පිලිැනීම. උදා:- සකෙවුස් පිළිගැනීම, රෝගීන්ට සුවය (ල. 5)

(ii) ***ස්නාවක ජොහන්ගේ සේවය***
මනස්ථාපනයේ බෞතීස්මය ලබාදීම, සියළු ජනකොටස් ජෝර්දාන් ගඟෙන් බෞතීස්මකිරීම, ජේසුස් වහන්සේව පිළිගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම, ජනතාවට දුන් අනුශාසනා ඉදිරිපත් කර තිබීම. (ල. 5)

(iii) ***මුල් ශ්‍රාවකයින් කැඳවීම***
ගෙනසරත් විල අසලදී සිදු කිරීම, සීමොන් හා ජේසුස් වහන්සේ අතර සංවාදය පේදුරුට දියඹට ගොස් දැල් හෙළන්න යනුවෙන් පැවසීම, ''ඔබගේ වචන නිසා දැල් හෙළමි'' යනුවෙන් පේදුරු කීකරු වීම. පේදුරු තම පාපී බව තේරුම් ගැනීම, මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇතයි යනුවෙන් පේදුරුතුමා ජේසුතුමාගේ අනුගාමිකත්වයට කැඳවීම විස්තර කර තිබිම. (ල. 5)

(iv) ***චර්මඡේදනය***
ඉශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසය සමග ඉතා ගැඹුරු සම්බන්ධතාවයක් පැවතීම, ඉශ්‍රායෙල් ආදි පීතෘ ආබ්‍රහම්තුමාගේ හා ඉන් මතු පරපුරට අදාල ලෙසට මෙම නියෝග දෙවියන් වහන්සේ විසින් ලබාදීම මෙම පිළිවෙත මගින් ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට සන්තක වීමේ තත්ත්වයට ඇතුලු වෙන බව මෙය බාහිර සංකේතයක් වන නමුදු පුද්ගලයාගේ ශරීරය තුළ එය දැරීමෙන් ''ජුදෙව් අනන්‍යතාවය'' සමාජය තුල දැරීමට පහසු කරවීම. ජේසුතුමාගේ දෙමව්පියන් ජේසුතුමා වෙනුවෙන් මෙම පිළිවෙත් ඉටු කර තිබූ බව. (ල. 5)